ආසියාවේ පළවන එකම කතෝලික ළමා පුවත් පත

LP - QD / 52/ News/ 2013

ක්‍රි. ව. 2013 ජූනි 03 සඳුදා
05 වෙළුම - 30 කලබ
සතිපතා පත්‍රය - පිටු 16
මිල රු 10.00

# ළමා ප්‍රදීපය






## 'ඥානාර්ථ ප්‍රදීපය'

## දශක ගණනාවක් පුරා කතෝලික ජනයාගේ නැණ පහන දැල්වූ ඉපැරණිම පුවත් පත

## 1866 ජූනි 07 වෙනිදා සිට අඛණ්ඩව........

ළමා ප්‍රදීපය
ආරම්භය - 2008 ඔක්තෝබර් 06 සඳුදා

කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 08. / දුරකතන අංකය - 2695984 / 4899611
ෆැක්ස් : 2692586 - ඊ-මේල් pradeepaya@yahoo.com
වෙබ් අඩවිය - www.colombocatholicpress.lk

# ආරාධිත ලිපියකට ඔබටත් ආරාධනා.

**ආදරණීය දුවේ පුතේ...**

මේ අලුත් මාසයේ පටන් අලුත් විශේෂාංගයක් ළමා ප්‍රදීපය ආරම්භ කරනවා. මම ඔබට ආරාධනා කරනවා ආගමික මුහුණුවර තුළ ඒ ඒ දින වලට උචිත වන ආකාරයෙන් වටිනා කතුවැකියක් හා සමාන ලිපියකින් මේ පිටුව සරසන්න මා හා එකතු වන්න කියා. ක්‍රිස්තු දේහයේ කොටසක් හැටියට එකට එකාබද්ධ වන අපි පුංචි කාලයේ ඉඳලම නිවැරදි ධර්මෝපදේශය තුළ කතෝලික දහමේ ධර්මදූත වරුන් / වරියන් වීම අත්‍යවශ්‍යයි. ඒ සඳහා ඔබ ආගමික පොත් පත් හා කතෝලික ධර්මෝපදේශය හොඳට පරිශීලනය කළ යුතුයි. ඒ අයුරින් සත්‍යතාවේ කරුණු කාරණා විමර්ශණය කරමින් අන් අයට එය සන්නිවේදනය කළ යුතුයි.

ඉතිං ආදර දුවේ පුතේ, සතියේ ජන වන්දනා ලිත අනුව යමින් අද ගම්පහ සිරිකුරුස විදුහලේ 12 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන රන්පොකුණගම නිම්නාදි රැදිගු දියණිය ''ඔබ උදෙසා දෙනු ලබන මේ මාගේ ශරීරයයි, මා සිහිකිරිම පිණිස මෙය සිදු කරන්න '' යන මැයෙන් ඉතාමත් වටිනා ලිපියකින් අද මා සමඟ මෙම පිටුව බෙදා ගන්නවා. ඉතිං මම පැවසූ අයුරෙන්ම මේ විශේෂාංගය ආරම්භ කරන්නේ නිම්නාදි රැදිගු දියණියයි. මේ අනුව මේ විශේෂාංගය මාසයකට වරක් පළ කරන්නට අපේක්ෂා කරනවා.

ඔබත් ධර්මෝපදේශය අනුව යමින් නිවැරදිව දහම හදාරා වටිනා අදහස් තුළ ඔබේ ආරාධිත කතු වැකි ලිපි මා වෙත නොපමාව ලැබෙන්න සලස්වන්න. මෙයින් ඔබ දහම පිළිබඳව හොඳ ගුරුවරයෙක් විය යුතුයි. ලිවීම සම්බන්ධයෙන් හොඳ ලේඛකයෙක් විය යුතුයි. ඒ අනාගත අපේක්ෂා සාර්ථක කර දෙන්නට ළමා ප්‍රදීපය කවදත් දුවේ පුතේ ඔබ වෙනුවෙන්ම විවෘතයි. මේ ආරාධනාව ඔබත් ඉත සිතින් පිළිගන්නා බව මාගේ ඇඩි විශ්වාසයයි.

**ඔබට ජේසු පිහිටයි.**

සංස්කාරක

ගරු ශාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමා

# ආරාධිත ලිපිය - 01

**''ඔබ උදෙසා දෙනු ලබන මේ මාගේ ශරීරයයි, මා සිහිකිරිම පිණිස මෙය සිදු කරන්න''**

කැඩී ගිය , බිඳී ගිය හා විසිරී ගිය අප සිත් තුළ වූ දේව විශ්වාසය නැවත වරක් පිහිටු වීම සඳහා පැමිණියාවූ ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ තම ප්‍රාණය කුරුස ගසේදී පිදීම හේතුවෙන් සදාකාලික ජීවනදායක භෝජනය බවට පත් වී අප අතර වැඩසිටීමට තීරණය කළ සේක. උන්වහන්සේ 'මා වේදනා විඳීමට පළමුවෙන් මේ පාස්කු භෝජනය ඔබ සමඟ වැළඳීමට ආශා වෙමි' යැයි පවසමින් අප සමඟ නතර වීමට සත්ප්‍රසාදීය ස්වාමීන් හා උන්වහන්සේගේ අමිල වූ රුධිරයෙන් කළ නව ගිවිසුම ස්ථාපිත කළ සේක. ඒ ජේසුස් වහන්සේගේ අති ප්‍රේමණීය හා උත්කෘෂ්ඨ වූ අන්තිම රාත්‍රී භෝජනය දිනදීය. එදා මුළු මහත් විශ්වයම ජන්ම පාපයෙන් වෙලී අකීකරුකමේ හා ආත්මාර්ථකමේ ගිලී පවතින විට කීකරුකමේ හා පරිත්‍යාගයේ සදා අමරණීය ප්‍රේමයේ සලකුණ ලකුණු කළේ උන්වහන්සේ විසින් සිදු කළ මෙම නව ගිවිසුම මගිනි.

උන්වහන්සේ ස්වකීය ගෝලයන් සමග ආහාර වලඳින්නට පෙර රොටි ගෙන තුති පුදා ඒවා කඩා ඔවුන්ටදී ''ඔබ උදෙසා දෙනු ලබන මේ මාගේ ශරීරයයි, මා සිහිකිරිම පිණිස මෙය සිදු කරන්නැයි'' වදාළ සේක. තමන් වහන්සේට මනුෂ්‍ය ශරීරයෙන් යුක්තව මිය යාමට ඇත්තේ එක් වතාවක් පමණක් බැවින් එය වෙනත් උසස් ආකාරයකින් එනම් ප්‍රසාද නිධානයක් හැටියට සිදු කරන්නට සැලසූ සේක. උන්වහන්සේගේ කුරුස ගත වීම තුළ කල්වාරියේදී වෙන් වූ ශු. රුධිරය හා ශු. ශරීරය, අද දිව්‍ය පූජාව තුළ පූප හා මිදිරස දිව්‍ය රහස් කිරීමෙන් සිහිපත් කරනු ලැබේ.

දිව්‍ය සත්ප්‍රසාදය නමැති සත්‍යතාවය මිනිසාට තේරුම් ගැනීමට අපහසුය. මාගේ මාංශය සැබෑ ආහාරයවේ. මාගේ රුධිරය සැබෑ පානය වේ. මාගේ මාංශය අනුභව කරන, මාගේ රුධිරය පානය කරන තැනැත්තේ මා තුළ ජීවත්වන්නේය. මමද ඔහු තුළ ජීවත් වන්නෙමි''යි ස්වාමීන් වහන්සේ වදාළ සේක. මිනිසාට සදාකාලික ජීවිතය ලබා ගැනීමට ඉවහල් වන යාගික පඬුර ක්‍රිස්තුස් වහන්සේගේ මනුෂ්‍ය ශරීරයේ මාංශය හා රුධිරය බව ජුවාම් තුමා පෙන්වා දෙයි. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ තුළ අපට ලැබෙන ශරීරය හා රුධිරය යම් දෙයක් නොව යම් කෙනෙකි. මීට වසර ගණනාවකට පෙර උන්වහන්සේගේ කාලයෙ ජනයාට දක්නට ලැබුණු ස්වාමීන් වහන්සේව අපිදු අත් දකිමු.

එදා මරණය පරාජය කර උත්ථානවූ උන්වහන්සේ අදත් අප අතර දිව්‍ය සත්ප්‍රසාදය තුළින් වැඩ සිටින සේක. එය පාපිවූ අපගේ පියවි ඇසට නොපෙනෙනු ඇත. එතුමා දිව්‍ය සත්ප්‍රසාදය තුළ නිහඬව වැඩ වසමින් අපගේ ක්‍රියාකාරකම් නරඹන සේක. එම නිසා අප සිදු කරන සැම දෙයක්ම, ප්‍රකාශ කරන සැම වචනයක්ම දෙවිඳුන්ට ප්‍රසන්න අයුරින් සිදු කරමින් මෙම විශ්වාසයේ වසර තුළ විශ්වාසයෙන් හා ඇදහිල්ලෙන් යුතුව ජීවත්වෙමු. උන්වහන්සේගේ මෙම ප්‍රේමණීය වැඩ සිටීම අපගේ බලය, සවිය හා සදා ජීවනය වේ.

**කේ.ඒ. නිම්නාදි රොද්‍රිගෝ**
**12 ශ්‍රේණිය**
**සිරිකුරුස විදුහල - ගම්පහ**

**මුද්දර ලෝකය**

**හඳුනා ගනිමු**

# මුද්දර මගින් ශ්‍රී ලංකාවේ ඉතිහාසය ඉගෙන ගනිමු.



මෙතැන් පටන් අපි ''මුද්දර ලෝකය හඳුනා ගනිමු'' තුළින් අප ඉගෙන ගන්නා විෂයන් බද්ධ කරගනිමු. ඒ සඳහා දුවේ පුතේ අපි මුලින්ම අපේ ඉතිහාසය ඉගෙන ගනිමු. ලංකාවේ මුද්දර කාර්යාංශය මගින් ''අතීත ශ්‍රී ලංකාව'' නමින් ශ්‍රී ලංකාවේ ඓතිහාසික ලක්‍ෂණ හා උරුමයන් දැක්වෙන මුද්දර පෙළක් වසර 08 ක කාලයක් තුළ නිකුත් කිරීමට සැලසුම් කර තිබෙනවා.

එහි ආරම්භක මුද්දර කාණ්ඩය ලෙස '' ප්‍රාග් ඓතිහාසික යුගය'' නමින් මුද්දර හතරක් රු.5 /_ රු.20/- රු.25 /- හා රු.30 - යන වටිනාකම්වලින් යුක්තව 2005 දෙසැම්බර් 21 වනදා දෙරට වැඩියා.වර්ග කි.මී. 60,000 ක්වූ අප කුඩා දිවයිනේ වසර එක්ලක්‍ෂ විසිපන්දහකට පමණ පෙර කාල පරිච්ඡේදය හඳුන් වන්නේ ප්‍රාග් ඓතිහාසික යුගය හැටි යටයි.

සියවස් දහසකට එහා ජීවත් වූ ආදිතමයන්ගේ අවශේෂ කොටස් හා ඔවුන් භාවිත කළ ද්‍රව්‍ය අනුව එම කාලය ශිලා යුගය ලෙසත් ප්‍රාග් නූතන මිනිසා විසූ කාලය මධ්‍ය ශිලා යුගය ලෙසත් ඔවුන්ගේ කෘෂි ආර්ථිකයට අදාළ ලෝහ භාණ්ඩ භාවිතවූ කාලය නව ශිලා යුගය ලෙසත් හැඳින්වේ.

මෙහිදී පුරා ශිලා යුගයේ මිනිසා නූගත් මෙන්ම ඔවුන් පරිනාමය සඳහා ගතවූ කාලය දීර්ඝවූ නිසා එම දිගු යුගය

1. පහළපුරා ශිලා යුගය
2. මධ්‍යපුරා ශිලා යුගය
3. ඉහළ පුරා ශිලා යුගය

යනුවෙන් නැවත යුග 3 ට බෙදුනි.

1. පහළ පුරා ශිලා යුගයට අයත් ගල් ආයුධ වසර ලක්‍ෂ දෙකහමාරකට පෙර කාලයට අයත් හෝමෝ හැමිලිස් මානවයන් මගින් තැනූ ඒවා බවට පුරා විද්‍යාඥයන් සැකකරයි.

2. මධ්‍ය පුරා ශිලා යුගයේ සාධකයන් හමුවන්නේ වෙරළ බඩ හා රත්නපුරය ආශ්‍රිතවත්, මිනිහාගල්කන්ද, උයන් ගොඩ , බුන්දල හා උතුරු කරයේ ඉරන මඩු ප්‍රදේශයන්හි පස් ස්ථරවලින් ලද ගල් ආයුධ මගිනි ලොව පුරා ව්‍යාප්ත සෘජු මිනිසා හෙවත් හෝමෝ ඉරෙක්ටස් නමින් දියුණු මානව වර්ගයා විසින් මේවා නිර්මාණය කර ඇති බව පිළිගැනේ.

3. ඉහළ පුරා ශිලා යුගය මෙහි අවසන් අවස්ථාව වුවත් එයට අයත් මානව ශේෂයක් හෝ ආයුධ මෙතෙක් අපරටේ කැණීම්වලින් හමුවී නැත. එබැවින් මෙම කාලවකවානුව පුරාවිද්‍යාඥයන්ටත් ගැටලු වක් වී ඇත.

✍ සිරිල් පෙරේරා

ඉහත දැක්වූ මධ්‍ය ශිලා යුගය මෙසොලිතිය යුගය යනුවෙන්ද සඳහන්වන අතර එය වසර හතලිස් දහසකට පෙර ජුද්‍ර ශිලා නම් ඉතා කුඩා ගල්මෙවලම් හා ආයුධ භාවිතකළ කාලය ලෙස සැලකේ. හෝමෝ මාපියන් සාපියන් නම් ප්‍රාග් නූතන මානවයා අප දිවයිනේ කුරුවිට, බටදෙඹලෙන, කිතුල්ගල, බෙලිලෙන , රහින්ගල ලෙන , මානියම්ගම බෙල්ලෙන, අස්මඩලාගල, සීගිරිය, අලිගම , පොතාන, පල්ලෙමල යන ප්‍රදේශයන්හි විසූ බවට සාක්ෂි සොයාගෙන ඇත.

නව ශිලා යුගයේ නව ශිලා කර්මාන්තයක ලක්‍ෂණ අපසතුව නැති නමුත් දෙරවක කන්දේ කරන ලද කැණීම් මගිනුත් මෑත කාලීන පාරිසරික හා උද්භිද අවශේෂ ගැන කළ පර්යේෂණයකින් අප රටේ මිනිසුන් මීට වසර දහතුන්දහකට පෙර කෘෂිකර්මාන්තය ගැන දැන සිටි බවට තොරතුරු සොයා ගෙන ඇත.

ඉදිරියට .......

# ළමා ඔබට සාරධර්ම



### ගුරු සිත නො රිදවා.....

කුඩා කල සිටම ගුරුවරුන්ගේ සිත් නො රිදවෙන අයුරින් වැඩකටයුතු කිරීමට අප පුරුදු පුහුණු විය යුතුය. ඔවුන් අපට උගන්වන්නාවූ සෑම කරුණක්ම ඉතා හොඳින් අපේ සිත් වල ධාරණය කර ගැනීමට අප සෑම විටම උත්සාහ ගත යුතුය. අධ්‍යාපනික කටයුතු වලදී අපට ගැටලු පැන නගිනා විට, අප නොපැකිලව, ඔවුන්ගේ ගුරුහරුකම් විමසා, ඒ අනුව වැඩ කිරීමට පුරුදු වීමෙන් අපේ දියුණුවට මඟ පාදා ගත හැකිය.

### වේලාව නො වරදවා.

වේලාවට වැඩ කටයුතු කිරීම අප කුඩා කල සිටම පුරුදු විය යුතු කරුණකි. තම වැඩ කටයුතු ප්‍රමාද කිරීම නිසා අපට පමණක් නොව, අප නිසා අන් අයට ද නොයෙකුත් දුෂ්කරතා වලට මුහුණ පෑමට සිදුවන අවස්ථා එමටයි. නිසි වේලාවට අවදිවීම, කල් වේලා ඇතිව පාසලට පැමිණීම වැනි කටයුතු අපේ දෛනික ජීවිතයේ අප විසින් පිළිපැදිය යුතු ඉතා වැදගත් කරුණුය. නියමිත වෙලාවට වැඩ කිරීමට පුරුදුවීමෙන් අපට මුලු මහත් සමාජයේම ගෞරවයට ද පාත්‍ර විය හැකිය.

### බැති පෙම් උපදවා.

ගුරුවරුන්ට ආදරය සහ ගෞරවය දැක්වීමට අප කුඩා කල පුරුදු විය යුතුය. ගුරුවරුන්ට ආචාරශීලීව සහ ගුරු ගෞරවය රැකෙන ලෙස කටයුතු කරන්නා වූ සිසු දරු දැරියන්ට ඔවුන්ගේ ආශිර්වාද නොමසුරුව ලැබෙන බව අප සැවොම හොඳින් දන්නා කරුණකි. ඒ හා සමානවම අනෙකුත් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ටද අපගේ කරුණාව දැක්වීමට අප වග බලා ගත යුතුය. ආදරය රැඳි පන්ති කාමර තුළින් බිහි වන කාරුණික ළමා පරපුර මුලු මහත් සමාජයටම වාසනාවකි.

### අකුරු උගනි කුමරු සොඳවා

ජාතියේ ජීවනාලිය වන දරු කැළ, කුඩා කල සිටම ඉගැනීමට මුල් තැන දිය යුතුය. වැඩි වැඩියෙන් අතිරේක පොත් පත් කියවීමෙන්, පන්ති කාමරයේදී ලබා ගන්නා දැනුම වැඩි දියුණු කර ගැනීමට අප හැකි පමණ උත්සහ කළ යුතු වෙයි. එලෙසම, අපගේ විවේක කාල වලදී, දැනුම පුළුල් කර ගැන්මට ඉවහල් වන්නාවූ අතිරේක වැඩ කටයුතු වල නිරත වීමෙන් අපට අපගේ ඥානය වර්ධනය කර ගැනීමට එය රුකුලක් කර ගත හැකි වන අතර, එය අප විසින් අපටම කර ගන්නා වූ මහඟු සේවයකි.

කුඩා කල සිටම අප ගුරු සිත නො රිදවන්නටත්, වේලාව නො වරදවා වැඩ කරන්නටත්, භක්ති ප්‍රේමයෙන් අන් අයට සැළකිලි දක්වන්නටත්, පුරුදු පුහුණු වුවහොත්, අපගේ ඉගෙනීමේ කටයුතු නිසියාකාරව කර ගෙන යාම අප කිසිම කෙනෙකුට අපහසු දෙයක් නොවන බව සක්සුදක් සේ පැහැදිලි කරුණකි.

**ෆ්‍රිඩා විල්ලවරායන්**
**ටොරොන්ටෝ , කැනඩාව .**

### මාසික සිතුවිල්ල - මැයි මස ජයග්‍රාහී නිර්මාණය



මරිය තුමි සමගිනා
අපි අත්වැල් බැඳගෙනා
කියමු කියමු ජපමාලය
සැවොම එක්වෙලා

මල් ගෙනැවිත් සරසලා
රුව ගන්වමු මරි මව්
කමා අයැදිමු පව් වලටා
දෙදණ බිම තබා

**රසිනි නිමාෂා පෙරේරා**
**07 ශ්‍රේණිය**
**සා. ජෝශප් විදුහල - මීගමුව ශාඛාව**

.................................

**මාසික සිතිවිල්ල**

**මාසික සිතිවිල්ල**
“ජුනි මාසය”
ළමා ප්‍රදීපය, අංක 02,
ඥානාර්ථ ප්‍රදීපය මාවත,
කොළඹ 08.



# ළමා ලේඛක වැඩමුළු



**හලාවත පදවිය**

කටුනේරිය මීසමේ සා. සෙබස්තියන් දහම් පාසලේ ළමුන් සඳහා ළමා ලේඛක වැඩමුළුවක් 2013 ජූනි 07 වන සෙනසුරාද පැවැත්වේ.

දහම් පාසලේ 9 වන ශ්‍රේණියේ සිට ඉහල ළමුන් සඳහා පැවැත්වෙන මෙය මෙහෙයවනු ලබන්නේ ළමා ප්‍රදීපය සහය සංස්කාරක කුමර නයනජිත් මහතාය. ළමුන්ගේ ලේඛක කුසලතා එළිදැක්වීමේ අරමුණින් යුතුව මීසම් සේවක ගරු සුනිල් විජේසිංහ පියතුමාගේ මඟ පෙන්වීම යටතේ මීසම් සහයක ගරු ඉමල්ක පීරිස් පියතුමන් විසින් දහම් පාසල් ආචාර්ය මඬුල්ලේ සහයෙන් මෙය සංවිධානය කරනු ලබයි.

**ශ්‍රිමාලි ප්‍රනාන්දු - කටුනේරිය**

**කොළඹ පදවිය**

ළමුන්ගේ ලේඛක කුසලතා එළිදැක්වීමේ අරමුණින් යුතුව මීගමුව ආවේ මරියා කන්‍යාරාමයේ 6 ශ්‍රේණියේ සිට ඉහල ළමුන් හට ළමා ලේඛක වැඩමුළුවක් 2013 ජූනි මස 09 ඉරුදින පාසල් ශාලාවේදී පැවැත්වේ. මෙය මෙහෙයවනු ලබන්නේ ළමා ප්‍රදීපය සහය සංස්කාරක කුමර නයනජිත් මහතාය. විදුහල්පති ගරු ශිරානි අල්ගම පැවිදි සොයුරියගේ (ය.ඒ.නි) මඟ පෙන්වීම යටතේ පාසල් මාධ්‍ය ඒකකය මගින් මෙය සංවිධානය කරනු ලබයි.

**මාධ්‍ය ඒකකය**

# ළමා ප්‍රදීපයෙන් ලේඛනයට පිවිසි පාසල් සිසුවියකගෙන් කෙටි කතා සංග්‍රහයක්...

ළමා ප්‍රදීපයෙන් ලේඛන කලාවට පිවිසි දංකොටුව බාලිකා මහ විදුහලේ සිප්සතර හදරන නවාංජනී තාරිකා ප්‍රනාන්දු සිසුවිය කෙටි කතා සංග්‍රහයක් පළ කර ඇත.

"මාවත අයිනේ අහිංසකාවියක්" නම් වූ මෙහි කෙටිකතා 11 ක් අන්තර්ගතය. ඇය දළුපත සා. අන්තෝනි දහම් පාසලේ ආදි සිදුවියකි. නවාංජනි පසුගියද තම ග්‍රන්ථය දංකොටුව බාලිකා මහ විදුහලේ විදුහල්පතිනි ගරු මේරි බර්නදෙත් (සුරදූතික නිකායික) පැවිදි සොයුරියට පිළිගැන්වූ අයුරු මෙහි දිස්වේ. මෙවර කලා අංශයෙන් උසස් පෙළ හැදෑරීමට සූදනම් වන නවාංජනිට ළමා ප්‍රදීපය සුබ පැතුම්

**කුමර නයනජිත්**



# ගම්පහ දිස්ත්‍රික්කයේ නැගී එන බලදක්ෂතා කිරුළ ගම්පහ සා. පීතර විදුහලට....

ගම්පහ දිස්ත්‍රික්කයේ "සිය නෑ ජම්බෝරේට්" බාල දක්ෂ කඳවුර පසුගිය ද උඩුගම්පොල සෙනරත් පරණ විතාන විදුහල් භූමියේදී පැවැත්වුණි. ගම්පහ බාල දක්ෂ සංගමය මගින් මෙම දිසා කඳවුර සංවිධානය කළහ. සුපිරි කණ්ඩායම් සහ නැගී එන කණ්ඩායම් වශයෙන් පාසල් 17 ක් මේ සඳහා තරග කළ අතර, නැගී එන බාල දක්ෂතා කණ්ඩායමක් වශයෙන් ඉතා තියුණු තරගයකින් ගම්පහ ශාන්ත පීතර විදුහල් කණ්ඩායම ප්‍රථම ස්ථානයට හිමි ශූරතාපලිහ දිනා ගන්නා ලදී.

විදුහල්පති ගරු චමින්ද වනිගසේකර පියතුමාගේ මගපෙන්වීම මත පාසලේ ආචාර්ය උදාර සම්පත් රුද්‍රිගු මහතා මෙම කණ්ඩායම භාරව කටයුතු කරන අතර පුහුණුකරු වශයෙන් බාල දක්ෂ නායක මසුර ප්‍රවීන් මහතා කටයුතු කරයි. මෙම ඡායාරූපයෙන් දැක්වෙනුයේ විදුහල්පති පියතුමා සමඟ බාල දක්ෂ කණ්ඩායම තමන්ට හිමි ශූරතා පලිහ සමඟ පෙනී සිටි අයුරු



**ජයන්ත ශ්‍රී පද්මකුමාර**

# 2013 අ.පො.ස. සා. පෙළ කතෝලික ධර්මය පුනරීක්ෂණ පාඩම් මාලාව

## පළමු තේමාව ඇසුරෙන් පළවු ප්‍රශ්න වලට පිළිතුරු (ප්‍රශ්න අංක 86 සිට 96 දක්වා පිළිතුරු)

86.
★ කතෝලික පූජකවරු රහසින් සැඟවී සිට හමුවුවහොත් මරණ දණ්ඩනය නියම කිරීම
★ සියලුම කතෝලික ධර්මදූතවරුන් පිටුවහල් කිරීම
★ කතෝලික සභාව සතු දේපල රාජ්‍ය සන්තක කිරීම
★ ලන්දේසි පාසල්වල රෝමානු කතෝලික ධර්මය ඉගැන්වීම් තහනම් කිරීම ඒ වෙනුවට සියලුම දරුවන්ට ඕලන්ද රෙප්‍රරමාදු ධර්මය ඉගැන්වීම.
★ රෙප්‍රරමාදු දෙව් මැදුරුවල බෞතීස්මය නොලැබු අයගේ උපත් ලියාපදිංචි නොකිරීම

87. ★ ජුසේවාස් පියතුමා

88. ★ ඔරතෝරියානු නිකාය

89. ★ මෙරට කතෝලිකයන් ලන්දේසීන්ගෙන් පීඩා විඳින විට කතෝලිකයන්ගේ විශ්වාසය ආරක්ෂා කිරීමට ජීවිත පරදුවට තබා කරනලද කැපවීම නිසා

★ ජුසේවාස් පියතුමා ලන්දේසි පාලන සමයේදී මෙරට කතෝලිකයන් අතරට නොපැමිණියේ නම් මෙරට කතෝලික ජනතාව සහමුලින්ම නැති වී යනු ස්ථිරය. එබැවින් එතුමා අපට වැදගත් වේ.

90. ★ නියං කාලය තුළ යාච්ඤා කර වැසි ලබාදීම
★ ඇඳුරු ඔයෙන් පාගමනින් එතෙර වීම
★ පුත්තලම ප්‍රදේශයෙහි තනි අලියෙකු මෙල්ල කිරීම

91. ★ ජාකෝමේ ගොන්සාල්වෙස් පියතුමා (ලක්දිව කතෝලික සාහිත්‍යයේ පියා)

92. ★ සුරදූත නිකායික පැවිදි සොයුරියෝ
★ ජපමාල නිකායික පැවිදි පියවරු හා පැවිදි සොයුරිය

93. ★ දේශිය භාෂාවන්ගෙන් ජනවන්දනාව පැවැත්වීම
★ ජන වන්දනා මෙහෙයන් සඳහා දේශිය සරසිලි යොදාගැනීම
උදා:- ගොක්කෙළ , පුන්කලස , පොල්තෙල් පහන
★ දේශිය සංස්කෘතිකාංග ජනවන්දනාවට යොදා ගැනීම
★ දේශිය ගෘහ නිර්මාණ ශිල්පීය ක්‍රම අනුව දේවස්ථාන ගොඩනැගීම
★ ගීතිකා සඳහා ජනගී ආර යොදා ගැනීම

94. ★ දෙමාපියන්ට ගරු කිරීම
★ ආගන්තුක සත්කාරය
★ වැඩිහිටි කෙනෙකු දුටුවිට නැගිට සිටීම
★ ආයුබෝවන් කීම
★ වැඩිහිටි අප පහළම අසුන්වල ඉඳෙගෙන සිටිද්දී කුඩා අය ඉහළ අසුන් වල නොසිටීම

95. ★ දිව්‍ය පූජාව
★ පවුලේ යාච්ඤා
★ වන්දනා ගමන්
★ භක්ති අභ්‍යාස
★ ආත්මීක පුන්‍ය ක්‍රියා
★ මරිය බැතිය
★ ශාරීරික පුන්‍ය ක්‍රියා
★ දේව ප්‍රසාද නිධානමය ජීවිතය
★ නුවාන හා දේවස්ථාන මංගල්‍යය

96.
★ පියතුමා හා එක්වී ජන වන්දනාව සංවිධානය කිරීම
★ තමන් සතුදෙය නැතිබැරි අය සමඟ බෙදාගනිමින් සංසය තුළ දයා ප්‍රේමය පුරුදු කිරීම
★ කුඩා අයගේ දහම් දැනුම නගාලීමට පියවර ගැනීම
★ යාච්ඤාව, භාවනාව හා ප්‍රසාද නිධානාත්මක ජීවිතයට හුරුපුරුදු වී ආධ්‍යාත්මිකත්වය ශක්තිමත් කර ගැනීම
★ අන්‍ය ආගමිකයන් හා සුහද සමීප සම්බන්ධතා ඇතිකරගෙන මීසමේ සාමය , සමගිය , සමානාත්ම තාවය ආරක්ෂා කරගැනීම

**ගරු ඩේමියන් පෙරේරා පියතුමා**

සිඟිති කතාව



# බඩගින්න තිබුණත්

කුමාර විමල් අයියාගෙන් ලැබුනු ටොපි බෑගයත් කඩල ගොටු ටිකත් පුංචි ලී පෙට්ටිය මත තබා ගෙන පාසල් වත්තේ ගේට්ටුව ළඟට ආවා. ගේට්ටුව ලග පුංචි ගල් පඩිය උඩින් වාඩිවීගත් ඔහු පුංචි ලී පෙට්ටිය එයාගේ දෙපා උඩින් තබාගෙන ටොපි බෑගය විවෘත කරලා ලී පෙට්ටිය පුරාම ටොපි ටික විසිරුවා. පාට පාටින් දිලිසෙන ටොපි ගොඩ දිහා බැලුව ඔහුට ටොපියක් කන්න ආස හිතුනත් හැම ටොපියක් ගැනම විමලේ අයියට වග කියන්න ඕනෑ බවත්, ටොපියක් වත් අඩු වුනොත් එයාට ලැබෙන රුපියල් දෙක තුනත් ලැබෙන්නේ නැති වගත්, පසක් වුණ නිසා කුමාර ඒ අදහස අත් හැරලා දැම්මා.

ගේට්ටුවෙන් ඇතුළු වෙලා පාසල් වත්තට යද්දී මුලින්ම හමු වන්නේ පස් වෙනි පංතිය. කුමාරගේ වයසේ ළමයි ඒ පන්තියේ සිංදු කියනවා කුමාරට ඇහෙනවා. ඔහුටත් හිතුනු වාර අනන්තයි පාසල් යන්න ඇත් නම් කොච්චර හොඳද කියලා. ඒත් බඩගින්න නිවා ගන්න එක ඒ ඔක්කොටම වඩා පළමු වෙන් කරන්න යෙදිලා තියෙන නිසා ඒ සිතිවිලි උපන් ගෙයිම මිය යනවා.

උදේට තේ උගුරක් වත් නොලැබුනු කුමාරට තදින්ම බඩගිනි දැනුනා. ඒත් ඒ බඩ ගින්න නිවා ගන්න තඹයක් වත් ඔහු ලග නෑ. බඩගින්න නිසාම ඔහු පාසල් වත්තේ පයිප්පය ලගට ගියා වතුර උගුරක් බොන්න.

වතුර බොන ගමන් නිකමට මෙන් අසල තිබුනු පන්තිය දිහා බැලුවා. පන්තිය හිස් ළමයි ඔක්කොම පිට්ටනියට ගිහිල්ලා ගුරුතුමීත් එක්ක. කුමාරට පෙනුනා පස් වෙනි පන්තිය යන නාම පුවරුවට යටින් තිබුනු රාක්කයේ ළමයින්ගේ කෑම පාර්සල් පේලියට තිබෙනවා. බඩගින්න වැඩිකම නිසා ඔහුට හිතුනා හිමිහිට පන්තියට රිංගලා කෑම පාර්සලයක් අර ගන්න.

නමුත් පුංචි කුමාර යමක් කරන්න ඉස්සර වෙලා කල්පනා කරන්න පුරුදු වෙලා හිටි නිසා ඔහුගේ හිත ඔහුටත් හොරෙන් කෑම පාර්සලය අයිති ළමයා දිහාවට ඇදිලා ගියා. ''පුතේ අද මා ලග සල්ලි නෑ'' පුතා ගිහින් කඩෙන් ණයට බනිස් ගෙඩියකුයි, කෙසෙල් ගෙඩියකුයි ඉල්ලාගෙන ඉස්කෝලේ යන්න.'' කුමාරට මතක් වුනා සමහර විට එයාලගේ අම්මා එයාට මේ කෑම එක දෙන්න ඇත්තේ මේ වගේ අමාරුතත්වයකින් වෙන්න ඇති කියලා.

ඔන්න එතකොට කුමාරට වැටහුනා තමා කරන්න ගිය වැඩේ කොච්චර නරකද කියලා.''නෑ මම කාගෙවත් කෑම එක හොරෙන් අරන් කන්නේ නෑ. මම ගිහින් එයාගෙන් කෑම ටිකක් ඉල්ල ගන්නවා.'' කුමාර තමාටම කියා ගත්තා.

මහින්ද නාමල්

## කොළඹ ශා. පීතර විදුහලේ බටහිර තූර්ය වාදක කණ්ඩායමට විශිෂ්ට ජයක්.



අධ්‍යාපන අමාත්‍යංශයේ අනුග්‍රහය ඇතිව ආදී රාජකීය ශිෂ්‍ය හට තූර්ය වාදක සංගමය විසින් සංවිධානය කරන ලද ප්‍රථම දීප ව්‍යාප්ත බටහිර තූර්ය වාදක තරගය කොළඹ 4 ශාන්ත පීතර විද්‍යාලීය බටහිර තූර්ය වාදක කණ්ඩායම විසින් ජයග්‍රහණය කරන ලදී. දිවයිනේ පාසල් 70 ක් අතරින් බටහිර තූර්යවාදක කණ්ඩායම් 35 ක් සහභාගි වූ මෙම තරගය අධ්‍යාපන අමාත්‍ය බන්දුල ගුණවර්ධන මහතාගේ ප්‍රධානත්වයෙන් රාජකීය විද්‍යාල ක්‍රීඩාංගනයේදී පැවැත්වුණි.

# තෙවන සහස්‍ර

# ඥානාර්

**මෙරට සිංහල පුවත්පත් ඉතිහාසයේ දැනට පළවන ඉපැරණිම පුවත්පත ඥානාර්ථ ප්‍රදීපයයි. දෙසට, බසට රැසට සේවය කරන්නට 1866 ජුනි 07 වැනිද ආරම්භවූ ඥානාර්ථ ප්‍රදීපය 2013 ජුනි 07 වැනිදට 148 වැනි වසරට පා තබන්නේ සිය වසරක් පසුකර මෙරට පළවන එකම සිංහල පුවත්පත ලෙස වාර්තා තබමිනි.**

ගරු පීටර් ඉලාරි පියතුමාගේ අධ්‍යක්ෂකත්වයෙන් හා බුද්ධිමත් ගුරු පියකු වූ ජුවන් ප්‍රනාන්දු සිරිමතාණන්ගේ සංස්කාරකත්වයෙන් කොළඹ 15, ෆිෂර්ස් හිල් (මාළු කන්ද) හි අංක 47 දරණ නිවසේ සිට ප්‍රකාශයට පත් කැරිණ.

හවුල් ගණන් නියමවූ කතෝලික සමාගමක් මුල් මුදල පවුම් 2000කින් ඇරැඹූ අතර ලක්දිව දක්ෂිණ ප්‍රදේශයේ අති උතුම් ඉලාරි යොන් සිල්ලානි රාජගුරු ප්‍රසාදින් වහන්සේගේ හා පියතුමන්ගේ ආධාරයෙන් මේ සමාගම පිහිටුවිය. රට පුරා සියලු ප්‍රදේශවලින් පාඨකයෝ වූහ. ඥානාර්ථ ප්‍රදීපය එම සමාගම මගින් ප්‍රසිද්ධ කිරීමට පටන් ගත් අතර සත්‍ය දේව ධර්මය , රාජනීතිය, ශිල්ප ශාස්ත්‍රය, වෙළෙඳම් කර්මාන්තාදියට අදළ වගවාස ගම්ද, මෙතෙර හා එතෙර තොරතුරුද, කතා හා දැන්වීම් සහ වැදගත් සිද්ධීන් ප්‍රසිද්ධ කිරීමට අරමුණු කැර තිබේ.

කොටහේන සාන්ත ලුසියා ආසන දෙව්මැදුරට යාබදව පැවැති අනත්දරු මඩම මුද්‍රණාලයේ මුලින් ඥානාර්ථ ප්‍රදීපය මුද්‍රණය වූ අතර පසුව 1901 දී කොළඹ කතෝලික මුද්‍රණාලය ස්ථාපිත කැර එහි පරිශ්‍රය බොරැල්ල අගරදගුරු මැදුරු බිමට සම්ප්‍රාප්ත විය.

එදා මෙදතුර ඥනාර්ථ ප්‍රදීපය සංස්කාරක මඬුල්ල මෙසේය ජුවන් ප්‍රනාන්දු මහතා, තෝමස් අම්බ්‍රෝස් ජයවර්ධන මහතා, වී චාර්ල්ස් පෙරේරා මහතා, ගරු ජෝන් පහමුණේ නි.ම.නි. පියතුමා ඒ.ජේ.දබරේරාමහතා, ඩී.පී. කුරුකුලසූරිය මහතා, ගරු මර්සලීන් ජයකොඩි නි.ම.නි පියතුමා, ගරු ඉග්නේෂස් ගම්ලත් පියතුමා, අති උතුම් ප්‍රැන්ක් මාකස් ප්‍රනාන්දු හිමි, අති උතුම් ඔස්වල්ඩ් ගෝමිස් හිමි, ගරු ජෝ.ඒ. වික්‍රමසිංහ පියතුමා, හෙක්ට වෙල්ගම්පල මහතා, ප්‍රැන්සිස් ලියනාරච්චි මහතා, ගරු බර්ට්‍රම් දබරේරා



# කයේ බබළන
# ථ ප්‍රදීපය

කිතුනු උරුමය












1866 ජුනි මස ප්‍රදීපයේ මුල් පිටුව

පියතුමා, ගරු බෙනඩික් ජෝශප් පියතුමා, ගරු සිරිල් ගාමිණී ප්‍රනාන්දු පියතුමා, ගරු ශාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමා (දැනටත්) අතින් අකුරු ඇමුණු යුගයේ ඇරඹී ඥානාර්ථ ප්‍රදීපය දැන් පිය මනිමින් සිටින්නේ ජයග්‍රාහී 150 වැනි සැතපුම් කණුව කරාය.

තෙල් නොසිඳෙන පහනක් ලෙස අවට එළිය කෙරෙමින් බබළන හෙයින් නොනිවී පවත්නේ යැයි මීට අඩසිය වසරකට පෙර ප්‍රකාශ කළේ මහා කවි රපියෙල් තෙන්න කෝන් ශූරීන්ය. කාලයේ තාලයට හැඩ ගැසෙමින් යුගයේ තාක්ෂණ අභියෝග හමුවේ නොසැලී මුහුණ දුන් ඥානාර්ථ ප්‍රදීපය නවීන පරිගණක තාක්ෂණයෙන් හැඩ ගැන්වී වෙබ් ඕෆ්සෙට් මුද්‍රණ යන්ත්‍රයෙන් කළ එළි බසින්නේ තෙවන සහස්‍රකයේ අභියෝග හමුවේද නොවැටී නොසැලී නොනිවී ආලෝකය පතුරුවා ලන්නටය. ඥානාර්ථ ප්‍රදීපය දිගුකල් දිනේවා.

ශිරාන් මෛත්‍රි



# ඉංග්‍රීසි පාඩම විශේෂයෙන් අ.පො.ස. (සා. පෙළ හා උ. පෙළ) සිසු සිසුවියන් සඳහා

ඉදිරිපත් කිරීම
මයිකල් ඇන්ජලෝ
ප්‍රනාන්දු විසිනි.

පාඩම් අංක : 96

## Shall / Should / Will / Would

### පසුගිය පාඩම හා සම්බන්ධයි

### Should

**Should** යෙදෙන අවස්ථාවන් කීපයක් තියෙනවා. අපට ඉංග්‍රීසියේදී නිතර භාවිතා කළ යුතු වන අත්‍යාවශ්‍ය යෙදුම් කීපයක් ගැන දැනුවත් වෙමු. ඇත්තෙන්ම **should** කියන්නෙ "යමක් කළ යුතුයි" කියන අදහස ප්‍රකාශ කිරීමට භාවිතා කෙරෙන වචනයක්. නමුත් කළ යුතුයි කිව්වම ඒකෙත් නොයෙක් අවස්ථාවන් පිළිබිඹු විය හැකියි. තදින් කියා සිටින හෝ ලිහිල්ව කියා සිටින අදහස් පිළිබිඹු විය හැකියි. ඒ නිසා ඒ **should** යෙදෙන එක් එක් අවස්ථාවන් වෙන් වෙන්ව හඳුනා ගන්න උත්සාහ කරමු.

1. යමක් කළා නම් හොඳයි කියන අදහස

අවවාද දීමේදී සහ තමන්ගේ අදහස් දැක්වීමේදී **Should** භාවිතා කළ හැකියි.

**නිදසුන්:-**

(a) You look tired. you **should** go to bed.
(යූ ලුක් ටයර්ඩ්. යූ ෂුඩ් ගෝටු බෙඩ්)
ඔයාට මහන්සි පාටයි. ඔයා ටිකක් නිදාගත යුතුයි.
(නිදාගත්ත නම් හොඳයි කියන අදහස.)

(b) The government **should** do more to reduce crime.
(ද ගවර්න්මන්ඩ් ෂුඩ් ඩූ මෝ(ර්) ටු රිඩියුස් ක්‍රයිම්)
අපරාධ අඩු කිරීමට රජය මීට වඩා යමක් කළ යුතුයි.
(කළා නම් හොඳයි කියන අදහස.)

(c) I think we **should** invite Mr. Perera to the party.
(අයි තින්ක් වී ෂුඩ් ඉන්වයිට් මිස්ට පෙරේරා ටු ද පාර්ටි)
මං හිතන්නෙ අපි මිස්ට පෙරේරාට පාටියට ආරාධනා කළ යුතුයි. (කළා නම් හොඳයි කියන අදහස.)

බොහෝ අවස්ථාවල දී මෙවැනි කළා නම් හොඳයි කියන අදහස දැක්වීමේදී "I think" (මම හිතන්නෙ) කියන අදහසත් නිතර යෙදෙනවා.

- **I think we should** invite him to the party.
මට හිතෙන්නෙ අපි එයාට පාටියට ආරාධනා කළ යුතුයි.

- **I think we should** help that poor student to buy some books. මං හිතන්නෙ අපි අර දුප්පත් ශිෂ්‍යාට උදව් කළ යුතුයි පොත් ටිකක් ගන්න.

ඒ වගේම should not (shouldn't) කියන වචනෙනුත් යමක් කිරීම ඒ තරම් හොඳ නැහැ කියන අදහස පල කරන්න පුළුවන්.

You shouldn't believe everything he says.
(යූ ෂුඩන්ට් බිලීව් එව්රිතිං හී සේස්)
ඔහු කියන හැම දේම ඔබ විශ්වාස කළ යුතු නෑ. (ඔහු කියන හැමදේම විශ්වාස කරන්න එපා කියන අදහස ලිහිල්ව.)

**You shouldn't speak** to your parents like that.
(යූ ෂුඩන්ට් ස්පීක් ටු යුව(ර්) පේරන්ට්ස් ලයික් දැට්)
ඔබේ දෙමාපියන්ට එහෙම කථා නොකළ යුතුය. (දෙමාපියන්ට එහෙම කථා කරන එක හරිනෑ කියන අදහස)

**You shouldn't spend** a lot of money on clothes.
(යූ ෂුඩන්ඩ් ස්පෙන්ඩ් අ ලොට් ඔෆ් මනි ඔන් ක්ලෝත්ස්)
ඇඳුම් වලට මුදල් ගොඩක් වැය නොකළ යුතුයි. (ඇඳුම් වලට වැඩිය වැඩිකිරීම ඒ තරම් හොඳ දෙයක් නෙවේ කියන අදහස.)

**Must** හෝ **have to** කියන වචන දෙකෙන් අපි ඇතැම් විට යමක් කළ යුතුයි කියන අදහස ප්‍රකාශ කිරීමට ප්‍රයෝජන ගන්නවා. ඒත් ඒ වචන ඉතා තදින් යමක් කළ යුතුයි කියන අදහස ප්‍රකාශ කිරීමටයි යොදන්නේ.

**Should** කියාන වචනයෙන් **Must** හෝ **have to** යන වචන තරම් තදින් අදහස් ප්‍රකාශ කිරීමක් කෙරෙන්නෙ නෑ.

- You should apologise (යූ ෂුඩ් ඇපොලොජයිස්)
ඔබ සමාව ගත යුතුයි. (එහෙම කළා නම් හොඳයි කියන අදහස)

- You must apologise. (යූ මස්ට් ඇපොලොජයිස්) ඔබ සමාව ගත යුතුයි. (යුතුමයි) වෙන විකල්පයක් නෑ කියන අදහස)
You have to apologise කියන්නෙත් ඒ අදහසයි.

You should come before 5. Ok? (යූ ෂුඩ් කම් බිෆෝ ෆයිව්. ඕ. කේ?) ඔබ පහට කලින් එන්න ඕන හොඳේ?
(පහට කලින් ආ යුතුයි යන්න ලිහිල්ව ප්‍රකාශ කිරීම.)

You **must** come before five.
(යූ මස්ට් කම් බිෆෝ ෆයිව්) කිව්වොත් ඔබ ස්ථිරවම ආ යුතුමයි කියන අදහස කියැවෙනවා.

You **should** see that film. (යූ ෂුඩ් සී දැට් ෆිල්ම්)
ඔබ ඒ චිත්‍රපටිය බැලිය යුතුයි.
ඒක හොඳ චිත්‍රපටියක්. බැලුවනං වටිනවා. බැලුවෙ නැත්තං අපරාදෙ වගේ අදහසක් මේ වැකියෙන් කියැවෙනවා.

You **must** see the film. If you want to write a criticism about it.
(යූ මස්ට් සී ද ෆිල්ම් ඉෆ් යූ වෝන්ට් ටු රයිට් අ ක්‍රිටිසිස්ම් එබවුට් ඉට්.
චිත්‍රපටිය ගැන විවේචනයක් ලිවිය යුතු නම් ඔබ චිත්‍රපටිය නැරඹිය යුතුමයි (නොකර බැහැ අත්‍යවශ්‍යයි කියන අදහස)

You have to see the film. if... යන වැකියෙන් කියැවෙන්නෙ ඒ අදහසමයි.

Should සහ Must අතර ඇති වෙනස ඔබට දැන් පැහැදිලි ඇති.

**Would / Should / Will / Shall** ගැන අපි අභ්‍යාසයක් කරල දැනුම තහවුරු කරගනිමු.

# ක්‍රිස්තියානි කලාව හා වන්දනාව 17

## දේවස්ථාන ගොඩ නැඟීමේ කලාව

එහෙත් හතර වෙනි ශත වර්ෂයේ රෝම පුරයේ තනනු ලැබූ ප්‍රධාන දේවස්ථාන හතර වන සාන්ත පේදුරු දේවස්ථානය, ශාන්ත පාවුළු දේවස්ථානය, ශාන්ත ජෝන් ලැටරන් දේවස්ථානය හා ශාන්ත මේරිමේජ දේවස්ථානය සඳහා සුළු සුළු වෙනස්කම් සහිතව යොදා ගනු ලැබුනේ එම ආකෘතිය ය. රෝමානු දේවස්ථාන ක්‍රමය සේ හැඳින්වුනේද එය ය.



ප්‍රායෝගික අගයකින් පමණක් යුක්ත වූ එම ඍජු ක්‍රමයේ රෝමානු කලා රටාව අධිරාජ්‍යයේ පෙරදිග කොටසේ ග්‍රීක භාෂාව කථා කළ බැතිමතුන් අතර එතරම් ජනප්‍රිය නොවීය. ඔවුන් දුටු පරිදි දේවස්ථානයක් තුළ සැලසුම් කළ යුතු වූයේ ආගමක අභිරහස්භාවය ප්‍රකාශ වෙන විලාශයකට ය. එසේම එයට ඇතුළුවන්නන් තුළ භක්තිමය හැඟීම් ජනිත කරවන විලාශයකට ය. එවැන්නකට ඍජු සැලැස්මකට වඩා නැවීම් වැනීම් සහිත සැලැස්මක්ද පැතලි සිවිලිම්වලට වඩා අර්ධ කවාකාර පියස්සවල්ද, දේවස්ථානය තුළම පරිපූර්ණ ආලෝකයකට වඩා අර්ධ අඳුරු අරුණෝද ආලෝකයක්ද වඩා යෝග්‍යයැයි මොවුන් සිතූහ.

එම චින්තනයට ගැලපෙන පරිදි, මොවුහු දක්ෂතම කලාකරුවන් යොදා දේවස්ථාන තැනීමට පටන් ගත්හ. එසේ අරඹන ලද කලා ක්‍රමය බිසන්තියානු කලාව සේ හැඳින්වෙන්නට විය. එසේ වූයේ බිසන්තියම ග්‍රීක කථාකරන ජනයාගේ අගනුවර පමණක් නොව ප්‍රධාන අධ්‍යාපන මධ්‍යස්ථානය හා කලා මධ්‍යස්ථානයද වූ නිසා ය.

එහෙත් මේ වන විට කොන්ස්තන්තීනු අධිරාජයා එය කොන්ස්තීනු පුරය සේ හඳුන්වා එය තම රාජ වාසයද කරගෙන තිබුණි. එම කොන්ස්තන්තීනු පුරයේ තනන ලද විවිධ දේවස්ථාන අතරින් ''සන්ටා සොපියා' (ශාන්ත ප්‍රඥාව) යන දේවස්ථානය බියන්තියානු ගොඩනැගිලි කලාවේ උසස්ම නිදර්ශනය සේ ගැනෙන්නට විය.

### ජුස්තියානු අධිරාජයාගේ කලා සේවාව

ක්‍රි.ව. 532 දී පැරණි ශාන්ත සොපියා දේවස්ථානය ගින්නකින් විනාශ වී ගියේය. එසේ සිදුවුයේ පළමුවෙනි ජුස්තියානු යන අධිරාජයාගේ පාලන සමයේදී ය. ක්‍රි.ව. 527 සිට 565 දක්වා බලයේ සිටි ඔහු රෝම අධිරාජ්‍යයේ පෙරදිග කොටසේ සිටි ශ්‍රේෂ්ඨ ගණයේ අධිරාජයකු සේ සැලකේ. ඔහු ඉතාමත් වේගවත් කාර්යක්ෂම භාවයකින් ආගම හා සංස්කෘතිය කෙරෙහි ලොකු ඇල්මකින්ද යුක්ත වූ කෙනෙකි.

ඔහුගේ රාජ්‍ය සමය තුළ ඔහුට මුහුණ දීමට සිදුවූ ප්‍රධාන ගැටලුවක් වූයේ ම්ලේච්ඡ ජාතීන්ගේ ආක්‍රමණික ක්‍රියා දාමය ය. එම ආක්‍රමණ නිසා රටවල් කිහිපයක් රෝම අධිරාජ්‍යයට අහිමි විය. පැරණි ග්‍රීක රෝම සම්භාවනීය සංස්කෘතිය පිරිහී ගොස් ම්ලේච්ඡ සංස්කෘතියක් පැතිරෙන්නට විය. ඇතිවෙමින් තිබුණ ඒ පරිහානිය වලක්වන්නට ඔහු දැඩි ලෙස ක්‍රියා කළේය. අධිරාජ්‍යයට අහිමි වූ රටවල් නැවත දිනාගැනීමේ අටියෙන් ඔහු තම බලගතු ම සේනාපතියා වූ බෙලිසාරියුස් එය සඳහා යෙදෙව්වේය. අප්‍රිකාවෙන්ද ඉතාලියෙන්ද ස්පාඤ්ඤයෙන්ද නැතිවූ කොටස් නැවත ලබා ගැනීමට ඔහුට එලෙස හැකිවිය.

පිරිහෙමින් පැවතුන සංස්කෘතිය ගොඩ නැඟීමට එකම ක්‍රමය අධිරාජ්‍යය පුරාම ක්‍රිස්තියානි සංස්කෘතිය පැතිරවීම බව ඔහු විශ්වාස කෙළේය. එය සඳහා ඔහු තම මුළු ජීවිත කාලයම කැප කළේය. රෝමානු නීති ක්‍රමය ප්‍රතිසංස්කරණය කර, යුරෝපයේ අධිකරණ ක්‍රමයට ක්‍රිස්තියානි රාමුවක් සැපයූයේ ය. ක්‍රිස්තියානි සභාවේ දේව ධර්ම ශාස්ත්‍රය , වන්දනා ක්‍රම, පාලන සංවිධානය යන හැම කටයුත්තක් සම්බන්ධයෙන්ම ඔහු ප්‍රමුඛත්වයක් ගෙන ක්‍රියා කළේය. ආගමික කටයුතු සඳහා ඔහුගේ මැදිහත්වීම හොඳ අරමුණු වලින් කරන ලද්දක් වුවද, ඒවායේ ප්‍රතිඵල නම් හැම විටකම ශුභ දායක නොවීය.

සාන්ත සොපියා දේවස්ථානය පිලිස්සී යෑම නිසා ක්‍රිස්තියානි සංස්කෘතියට කිසිදා නොමැකෙන සේවයක් කිරීමට ඔහුට ඉඩකඩ සැලසුණේය. එම දේවස්ථානය අලුතෙන්ම සැලසුම්කර අවුරුදු පහකින් එය ගොඩනගා අවසන් කෙළේය.

**සංස්කාරක පියතුමන් විසිනි**

**ඉදිරියට .......**

# පුංචි අපේ චිත්‍ර පිටුව



**පල්ලියක්**
**ප්‍රිමේෂා මාටිනෝ**
02 ශ්‍රේණිය
ශුද්ධවූ පවුලේ කන්‍යාරාමය
බම්බලපිටිය

පුංචි අපේ චිත්‍ර පිටුව සඳහා ඔබ අඳින චිත්‍ර, A4 ( හාෆ්ෂීට් කොලවල ඇඳ ) පාසලේ හෝ දහම් පාසලේ පංති භාර ගුරුතුමාගේ සහතිකය සමග ඔබේ නම, පංතිය, පාසල ඇතුළත්ව ඔබේ පෞද්ගලික ලිපිනය හා දුරකතන අංකය ද සහිතව යොමු කරන්න.

"පුංචි අපේ චිත්‍ර පිටුව"
ළමා ප්‍රදීපය, අංක 02,
ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08.



**දෙව්පියා මැවූ ලස්සන ලෝකය**
**මිෂාල් නිම්නෙත්**
01 ශ්‍රේණිය
සාන්ත පීතර විදුහල
කොළඹ 04



**සුන්දර ගම්මානයක්**
**ශානුක දිසානායක**
04 ශ්‍රේණිය
සාන්ත පීතර විදුහල
උඩුගම්පොල



**පරිසරයේ අසිරිය**
**එලිෂා රශ්මි පූජා**
07 ශ්‍රේණිය
ශු. ජපමාල මාතා
දහම් පාසල
කුඩාමඩු වැල්ල
(තොඩුවාව මීසම)



**සිංහලේ සිංහයා**
**කවිශ් හිතාශ**
04 ශ්‍රේණිය
සාන්ත මයිකල්
දහම් පාසල
වේයන්ගොඩ
(නිට්ටඹුව මීසම)



**දයාවේ ජේසුස් වහන්සේ**
**පෝෂක බෝගහලන්ද**
07 ශ්‍රේණිය
සාන්ත
ජෝශප්
විදුහල
කොළඹ 10

# සාන්ත III වන ලියෝ ශුද්ධෝත්තම පියතුමා

ක්‍රි.ව. 795 දෙසැම්බර් 26 වන දින හේඩ්‍රියන් ශුද්ධෝත්තම පියතුමාගෙන් පසුව ශුද්ධාසනයට තේරී පත්වූ III වන ලියෝ පාප්තුමා සුදු සබයේ අනර්ඝ බැබලෙන තාරකාවක් ද එඬේරෙක්ද වන්නාහ.

මෙතුමාගේ පදවි ප්‍රාප්තියෙන් පසුව එතුමා භායානක අවදානමකට මුහුණ පා සිටින බව ලියෝ පාප්තුමනට හැඟුණෝය. එනම් එතුමාගේ නෑයෙකු වූ කාදිනල්වරයෙකු පාප්තනතුරකට පත්වීමට සැලසුම් කර තිබීමය. ඒ සඳහා කදිම සූක්ෂ්ම සැලැස්මක් දැමූ ඔහු ක්‍රි.ව 799 අප්‍රේල් 25 වන දින එතුමා රෝමයේ විදී පුරා පෙරහරකින් යමින් සිටියදී. කුලීකාර ඝාතකයෝ එතුමන් පැහැර ගෙන ගියහ. එතුමා ඇඳිරි ගෙයක සිර කර තබා එතුමාගේ දෑස් ගලවා දිව කැපීමට උත්සහ කළෝය. නමුත් ලියෝ පාප්තුමන්ගේ හා සභාවේ වාසනාවකට මෙන් පාප්තුමාගේ ආරක්ෂකයෝ එතුමන්ව බේරා ගත් අතර ඉතා ඉක්මනින් එතුමාණන් අසල තිබූ තාපසාරාමයක් වෙත ගෙන ගොස් දෑස් හා දිව නැවත සකස් කර ප්‍රතිකාර කරනු ලැබිණි. සුවය ලබමින් සිටියදී එතුමා ප්‍රංශය වෙත ගෙන යන ලදි. මහා චාර්ල්ස් රජු එතුමන් ගෞරවයෙන් යුතුව පිළිගෙන එතුමන්ගේ හොඳම වෛද්‍යවරුන් ලවා ප්‍රතිකාර කරන ලදී. සම්පූර්ණ සුවය ලැබීමෙන් පසුව විශාල හමුදාවක් සමඟ එතුමාණන්ව රෝමයට යවන ලදි. ලියෝ පාප්තුමාගේ නැවත පැමිණීම පිළිබඳව රෝම වැසියෝ උද්දාමයට පත්වුණි. තවද ප්‍රංශ රජතුමා ඉතා ඉක්මනින් පැමිණ වරදකරුවන් සියල්ලන් අත්අඩංගුවට ගත්තේය. ක්‍රි.ව. 800 නත්තල් දින මහා චාල්ස් අගරජ ශු. පේදුරුතුමාගේ සොහොන අසල දණගසා සිටියදී ලියෝ පාප්තුමා රෝමයේ අගරජ ලෙසද, සභාවේ ආරක්ෂකයා ලෙස ද පත් කළ අතර එතැන් සිට වසර 1000 පමණ දිගු කලක් තිබූ ශුද්ධ රෝම අධිරාජ්‍යයේ ආරම්භය විය. තවද පෙරදිග සභාවේ පූජකවරුන් හා තපස්වරුන් අගරජට එරෙහිව විරෝධය ප්‍රකාශ කළ අතර අගරජ ඔවුන් නෙරපා දමමින් දඬුවම් කළේය. මෙහිදි ලියෝ පාප්තුමා ඔවුන් වෙත සැලකිල්ල දක්වා තමන්ගේ භාරයට ගන්නා ලදි. ක්‍රි.ව. 814 දී මහා චාල්ස් අගරජ මිය ගිය අතර ඔහුගේ මරණින් පසුව ලියෝ පාප්තුමාගේ එදිරිවාදකරුවෝ නැවතත් එතුමන් මරණයට පත් කිරීමට වෙර දැරූහ. ලියෝ පාප්තුමන් විනාශ කිරීමට සැලසුම් කරන ලදී. එවැනි තැනක් අනාවරණ වීමෙන් එතුමා මරණින් බේරුණි. මෙලෙස වසර 21 ක කාලයක්, අභීතව හා යහපත් එඬේරකු ලෙස ක්‍රියා කළ ලියෝ පාප්තුමාගේ සුදුවර බව සියල්ලන්ට විද්‍යමාන වූ අතර වර්ෂ 816 ජුනි 12 වනදා එතුමා ස්වර්ගස්ථ විය එතුමාගේ මංගල්‍යය ජුනි 04 වන දින සමරනු ලබයි.



**අසේල දසනායක විසිනි**



## ප්‍රහේලිකා අංක 38

**හරහට**

1. ශු. බයිබලයේ සඳහන් වන කිසිදු නොකැපු තම හිස කෙස්වල යෝධ ශක්තියක් තිබූ තැනැත්තාගේ නම

4. ''................ වයා හිමි තුමන් පසසන්න එතුමන්ට පැසසුම් ගී ගයන්න'' යනුවෙන් ගීතාවලියෙ සඳහන් වෙයි. හිස්තැනට සුදුසු වචනය.

5. දෙවිඳුන්ගෙන් අප ලද හැකියාවන් වර්ධනය කරගතයුතු බව .......... පිළිබඳ උපමාව මගින් ක්‍රිස්තුන් වහන්සේ පහදා දුන් සේක. මෙහි හිස්තැනට සුදුසු වචනය.

8. මුහුද මත ක්‍රිස්තුන් වහන්සේ වෙතට ඇවිදගෙන ගිය පේදුරුතුමා අතර මගදී මෙසේ කළ නිසා මුහුදේ ගිලෙන්නට පටන් ගත්තේය.

9. මිනිස්සු අංශභාග රෝගියාව ....... ක තබා ක්‍රිස්තුන් වහන්සේ වෙතට ගෙනාහ. මෙහි හිස් තැනට සුදුසු වචනය.

**පහළට**

1. ක්‍රිස්තුන් වහන්සේ .......හා විපත පිළිබඳව තම ශ්‍රාවකයන්ට පහදා දුන් සේක. හිස්තැනට සුදුසු වචනය.

2. ..... දෙන කන ඥානවන්තයාගේ අපේක්ෂාව වන්නේය. යනුවෙන් උපදේශකයා හෙවත් සිරාක් පවසයි.

3. ප්‍රඥාතමෝ ඇයව සොයන්නට තම රහස් ............. කරන බව උප දේශකයා හෙවත් සිරාක් පවසයි.

6. ක්‍රිස්තුන් වහන්සේ කුරුසියේ උකුත් වූ පසු අරමිතියේ ජෝසෙප් උන්වහන්සේගේ සිරුර ගල් ........ තැන්පත් කළේය. හිස්තැනට සුදුසු වචනය.

7. ක්‍රිස්තුන් වහන්සේ තම අන්තිම රාත්‍රී භෝජනයට පසු තම ශ්‍රාවකයන්ගේ පාද සේදීමට පෙර උතුරු සළුව ගලවා තබා මෙය ගෙන ඉණ වටා බැඳගත් සේක.

8. ''ස්වාමින්ගේ දූතයා මරිය තුමියට .............. කළා යනුවෙන් තුන්කාල ආරාධනාවේ සඳහන් වෙයි. මෙහි හිස්තැනට සුදුසු වචනය.

**(මෙම ප්‍රහේලිකාව පිරවීමේ දී පහත සඳහන් බයිබල් පාඨ ද උපයෝගී කර ගත හැකිය. වීරාවලිය 13, උපදේශකයා හෙවත් සිරාක් 3/29, 4/11, ශු. ලුක් 6/ 20, 5 / 18, 19/ 11, ශු. මතේව් 14/31 , ශු ජුවාම් 13, ගීතාවලිය 33 )**

**සැකසුම :- තිළිණි දුතිකා පෙරේරා** – කිරිමැටියාගාර

---

**කෙටි කතා සංග්‍රහයක් එළිදැක්වූ නවංජනී තාරිකා ලමා ලේඛිකාව අප වෙත එවන ලද ලිපියකි.**

# මා සතු ලේඛන හැකියාවන් ඔප් නැංවීමට දිරිය දුන්නේ "ළමා ප්‍රදීපය"යි.




වර්ෂ 2009 ජනවාරි 18 දිනෙන් ඇරඹුන මගේ ලේඛන කුසලතාව දිනෙන් දින ඔප් නංවගෙන නිසදැස්, සැදැස්, සිතුවිලි සහ කෙටි කතා ලියු අතර ඒ මා ලියන හැම දෙයක්ම අගය කරමින් මා ධෛර්යමත් කළේ ළමා ප්‍රදීපයයි. එහි ප්‍රතිඵලයක් ලෙස ''මාවත අයිනේ අහිංසකාවියක්'' නැමති මගේ කුළුඳුල් නිර්මාණය එළි දැක්වීමට හැකිවීම පිළිබඳව මම සන්තෝෂ වෙමි.

විශේෂයෙන් ළමා ප්‍රදීපය සංස්කාරක ගරු ශාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමාටත් සහය සංස්කාරක කුමර නයනජිත් සොයුරාටත් මාගේ අවංක ස්තූතිය මේ මොහොතේ පුද කරමි. නිරන්තරව මා දිරිමත් කරමින් මා සතු ලේඛන ශෛලිය වඩාත් හොඳින් ප්‍රගුණ කර ගැනීමට මට ශක්තියක් වුනේ ඔබයි. තව තවත් ඉදිරියට යමින් ළමා ලේඛකයින් සමාජයට දායාද කිරීමට හැකිවේවායි මම ඉත සිතින් ප්‍රාර්ථනා කරමි.

**නවංජනී තාරිකා ප්‍රනාන්දු**
2013 උසස් පෙළ (කලා අංශය)
හලා/වෙන්/ දන්කොටුව බාලිකා මහ විදුහල


මෝසෙස් 3
ශුද්ධවූ බයිබලය ඇසුරෙන් චිත්‍ර කතා රචනය ආනන්ද කල්දේරා. දෙබස්, චිත්‍ර ඇස්. ඩී. පී... සදුආරච්චි
යාකොබ් සිය දරුවන් සමඟ ගෝෂෙන් හි පදිංචි විය.. කාලයක් ගතවිය.. යාකොබ් සහ ඔහුගේ පවුලේ අය මියගිය අතර ඔවුන් ගෙන් පැවත එන ඊශ්‍රායෙල්වරුන් වන හීබෲ ජාතිකයින්ගේ.. ගණන වේගෙන් ඉතා වැඩිවිය...
ඔවුන් එහි බැටළුවන් ඇතිකර, ගොවිතැන් කරගෙන ජීවිකාව ගෙන ගියේය...
නමුත් ඊශ්‍රායෙල්වරුන්ට විරුද්ධව වැඩකරන රජකෙනෙක් ඊජිප්තුවේ රජකමට පත්විය.. ඔහු නමින් පාරාවෝය...
රජතුමනි.. මෙහි වාසය කරන.. ඊශ්‍රායෙල් වරුන් ගේ ප්‍රමාණය බොහෝ සේ ..වැඩිවී ඇත..
මොනවා..
කවදාහෝ මෙහි යුද්ධයක් ඇතිවුවහොත් ඔවුන් අපේ සතුරන් සමඟ එක්වී අපට විරුද්ධව සටන් කරයි...
එහෙමද එසේනම් ඔවුන්ගේ බලය අපි කෙසේ හෝ අඩුකළ යුතුයි
අපි ඔවුන්ව මෙහි වහලුන් බවට පත් කරමු....
අපි එතෙන් ගබඩා නගරයන් දෙකක් අපි ඔවුන් ලවා සාදවමු.. ඔවුන්ව තලා පෙළා වැඩ ගනිමු.. එවිට ඔවුන්ගේ බලය අඩුවී අධෛර්යයට.. පත්වෙයි..

ශු. ප්‍රැන්සිස් මුණිඳුන්ගේ

කතාව

# අසීසි නගරයේ දිළින්දා

ඉදිරිපත් කිරීම - ආමල් ද සිල්වා

26












මැයි මංගල්‍යය සැමරුම

මුද්දර ලෝකය
හඳුනා ගනිමු

පොඩි ෆාදර් ලියයි
ගරු නිරංජන් විජේරත්න
(සා. බෙ. නි.) පියතුමා

මමයි ජීවමාන ජේසුයි
[ දිව්‍ය සත්ප්‍රසාදිය ළමා ක්‍රියාකාරකම් ]

නිවාසන්තර ක්‍රීඩා

බයිබලයයි
පුංචි මමයි
ගරු එස්. රන්දිල් ප්‍රනාන්දු
(නි.ම.නි) පියතුමන් විසිනි

උපමාවට ඔවදනක්
චතුරංගි අක්කා විසිනි

සුදතුම් වරම් ලැබීම

කිතුනු ළමා හමුව

සිඟිති කතාව

අපේ ළමා පොළ

සුදුවර චරිතයක්
හඳුනාගනිමු

ජේසුගෙන් ළමා ඔබට

විශ්ව දින පොත

දිළෙන මිණි මුතු

කිතුනු උරුමය

ලොව කිතුනු කලා අසිරිය

පිපෙන මල් යාය

සිසු නායක පදක්කම් පැළැඳවීම

ගුරු ඔවදනක්

# ලබන සතියට

රත්නපුර දහම් ළමුන්ට පුස්තකාලයක්

පසුගියද රත්නපුර සාන්ත පාවුලු දහම් පාසලේ පුස්තකාලය විවෘත කෙරිණි. ඉංග්‍රීසි සිංහල දෙමළ පොත්පත් අඩංගු මෙම පුස්තකාලය සඳහා මූල්‍යමය ආධාර සැපයුවේ රත්නපුර විසු සෙල්වම් පිච්චේ මහතා අනුස්මරණය කරමින් පවුලේ ඥාතීන් විසිනි. ඡායා රූපයෙන් දැක්වෙන්නේ පුස්තකාලය විවෘත කෙරෙන අවස්ථාවයි. වම් පසින් රත්නපුර මිසම් සේවක ගරු රන්ජන්මාල් මොරායස් පියතුමාත්, දකුණු පසින් පිච්චේ මහතාගේ දියණිය ගාල්ල ශ්‍රී හෘදය කන්‍යාරාම විදුහල්පතිනි ගරු පැවිදි සොයුරියද වෙයි.

තියබෝල්ඩ් සමරතුංග

**දිය නාන ළඳුන්**
**හිමංසලා මල්ෂානි**
03 ශ්‍රේණිය
සිරිහඳ දහම් පාසල - බොල්ලත

මීගමුව ආවේ මරියා බාලිකා විදුහලේ මාධ්‍ය ඒකකය පසුගිය දා ආරම්භ කළ අතර මෙහි කමිටු ප්‍රධානීන් හට නිල ලාංඡන පැළඳවීම සිදු කෙරිනි. මෙය මීගමුව මහවීදිය මීසම් සේවක ගරු ශ්‍රියානන්ද ප්‍රනාන්දු පියතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුණි. මේ සඳහා විදුහල්පති ගරු ශිරානි අල්ගම පැවිදි සොයුරියගේ නොමඳ සහය ලැබිණි.

මාධ්‍ය ඒකකයේ අධ්‍යක්ෂිකා
රූත් ප්‍රනාන්දු

**වතුර වයින් කිරීමේ ප්‍රාතිහාර්ය**
**මිෂිකා පෙරේරා**
04 ශ්‍රේණිය
සාන්ත බ්‍රිජට් කන්‍යාරාමය - කොළඹ 07

**කළුකරයේ අසිරිය**
**ඊ.ඒ. ප්‍රවීන්**
05 ශ්‍රේණිය
සදසරණ දේව මාතා දහම් පාසල - පරකඩුව
(දෙහිගහපිටිය මීසම)

පළමු වරට දිව බොදුන් ලැබීම

බටගම සා. අන්තෝනි දෙව්මැදුරේ ළමෝ 90 දෙනෙකු පසුගියද පළමු වරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගත්හ. මීසම් සේවක ගරු නිශාන් විලත්ගමුව, මීසම් සහයක ගරු ජුඩ් ක්‍රිස්මන් පියතුමන්ලා සමඟින් ගරු පැවිදි සොයුරිය හා දහම් ගුරුභවතුන් සමඟ දිව බොඳුන් ලැබූළමුන් ළමා ප්‍රදීපය සඳහා සමූහ සේයාරුවකට පෙනී සිටි අයුරු.

අශේන් සේනාරත්න

**මුහුදු වෙරළ**
**සෙව්මිණි විහංගිකා**
08 ශ්‍රේණිය
සුරදූතික බාලිකා අපේක්ෂාවේ පාසල - පයාගල

## ධර්මදූත ළමා සමාජිකයිනට මෙන්න අනගි අවස්ථාවක් !

**ශ්‍රී ලංකාවේ ධර්මදූත ළමා සමාජයේ 25වෙනි සංවත්සරය නිමිති කරගෙන නිර්මාණය කිරීමට අපේක්ෂා කරන සංයුක්ත තැටියට ගීත රචනා කිරීමට ධර්මදූත ළමා සමාජ ළමුන්ට හා සජීවක සජීවිකාවන්ට කෙරෙන සුහද ආරාධනයයි !**

**තේමාව : "දේව රාජ්‍යය ගොඩනැගීම සඳහා මිනිස් වටිනාකම් ඉස්මතු කෙරෙන ගීතයන්"**

**පුන ගැයිය : (Chorus) සහ**

**ගැයිය දෙකක් (2 verses)**

**ඔබගේ නිර්මාණය සමඟ පහත කූපනයද පුරවා 2012 පෙබරවාරි මස 29 වෙනිදාට පෙර අප වෙත එවන්න.**

නම:- ..............................................................

ලිපිනය :- ........................................................

ධර්මදූත ළමා සමාජ
ඒකකයේ නම :- ..................................................

මීසම :- ............................................................

පදවිය :- ..........................................................

මීසම් භාර පියතුමාගේ නම,
අත්සන හා නිලමුද්‍රාව :- ......................................

**අපගේ ලිපිනය :**
**ජාතික අධ්‍යක්ෂ පියතුමා**
**ශුද්ධාසනීය ධර්මදූත ළමා සමාජය**
**නො : 19, බැල්කම් පෙදෙස,**
**කොළඹ - 08.**
**දුරකථන අංකය : 011-2685673**

---

**නිවැරදිව ප්‍රහේළිකාව පුරවා තැපැල් පත් මගින් පමණක්, ප්‍රහේළිකා අංක 32, ළමා ප්‍රදීපය, අංක 02, ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08 යන ලිපිනයට එවන්න.**

---

## ඔබ එළිදක්වන පොත්පත් වලට අපෙන් ඉඩක් ...

ඔබ පාසලේ, මීසමේ දහම් පාසලේ එළි දක්වන, ළමා පොත්, සඟරා හා පුවත් පත් පිළිබඳව තොරතුරු අපට ලියා එවන්න. ඒවා ළමා ප්‍රදීපයේ පළ කිරීමට අපි සූදානම්. එම විස්තර පහත ලිපිනයට යොමු කරන්න.

**"පොත් පත්"**
ළමා ප්‍රදීපය, අංක 02,
ඥානාර්ථ ප්‍රදීපය මාවත - කොළඹ 08

---

**ළමා ප්‍රදීපය පාස්කු කලාපයට නිර්මාණ එවන්න.**

ළමා ප්‍රදීපය විශේෂ පාස්කු කලාපය සඳහා පාස්කුව හා බැඳි ඔබගේ නිර්මාණ ( සඳැස්, නිසැඳැස්, ලිපි, කෙටි කතා ) අප වෙත යොමු කරන්න. ඔබගේ නිර්මාණ මාර්තු 26 වන දිනට පෙර,

ළමා ප්‍රදීපය "පාස්කු කලාපය" අංක 02, ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08. යන ලිපිනයට අප වෙත එවන්න.

සංස්කාරක පියතුමා

---

## ඔබේ දහම් පාසල ගැන අපිට ලියලා එවන්න ...

ඔබේ දහම් පාසල පිළිබඳව තොරතුරු, දහම් පාසලේ ළමුන්, ආචාර්යය මණ්ඩලය හා සිසු නායකයින්ගේද සේයාරූ සමඟ අප වෙත යොමු කරන්න.

අපේ දහම් පාසල, ළමා ප්‍රදීපය,
අංක 02, ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08.

---

දහම් පාසල් හා පාසල් වල දිව බොදුන් ලැබීම් හා සුදතුම් වරම් ලැබීම් වල ඔබ එවන සේයාරූ පැහැදිලි විය යුතු අතර සමූහ සේයාරුවක් පමණක් අපට එවන්න. එසේම දිව බොදුන්, සුදතුම් වරම් ලැබූ ළමුන් සංඛ්‍යාවද සඳහන් කර එවන්න. ළමා ප්‍රදීපයේ පළ කිරීමට ඔබ එවන සේයා රූ පළ කිරීමේදී අප විසින් මෙහි සඳහන් කරුණු පිළිබඳව වඩාත් සැලකිලිමත් වන බව කරුණාවෙන් සළකන්න.

සංස්කාරක පියතුමා